සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

ANSWER

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | |
|---|---|---|---|
| 9 | සිංහල භාෂාව හා සාහිත්‍යය | I ,II | පිළිතුරු පත්‍රය |

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 06. | 1 | 11. | 2 | 16. | 3 |
| 02. | 4 | 07. | 4 | 12. | 3 | 17. | 3 |
| 03. | 2 | 08. | 3 | 13. | 2 | 18. | 4 |
| 04. | 1 | 09. | 1 | 14. | 2 | 19. | 3 |
| 05. | 3 | 10. | 3 | 15. | 2 | 20. | 2 |

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

01. අසා ඇති ප්‍රශ්නවලට නියමිත පිළිතුරු ලබා දී ඇත්නම් ලකුණු පිරිනමන්න.
(ලකුණු 16)

02. ● රචනාව සඳහා
සාරවත් භාවය (ලකුණු 05)
සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය (ලකුණු 06)
ශිල්පීය දක්ෂතා හා ඡේදවලට බෙදීම (ලකුණු 03)
(සමස්ත ලකුණු 14)

03. ● ප්‍රායෝගික ලේඛනය සඳහා
ආකෘතිය (ලකුණු 04)
අන්තර්ගතය (ලකුණු 04)
ශිල්පීය දක්ෂතා (ලකුණු 02)
(සමස්ත ලකුණු 10)

04. (අ) (i) සිරිසෝම / පී. එච්. අයි. මහත්තයා
(ii) මහජන සෞඛ්‍ය පරීක්ෂක
(ආ) (i) මුදලිහාමිට
(ii) මුදලිහාමිට කලිසමක් මැසීමට මිම්ම ලබා දීම සඳහා
(ඇ) (i) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර
(ii) දාසියගේ අතින් මහාසාර පලඳනාව උදුරාගෙන ගිය බවට හඳුන්වා දුන් පුද්ගලයා / ගැමියා
(ඈ) (i) බුලත් කවන්නවුන්
(ii) ධර්මසේන හිමි
(ඉ) (i) කලාසූරී ජගත් විමලසුරේන්ද්‍ර මහතා
(ii) කෑගල්ල, අල්ගම, ''නෘත්‍ය'' කලායතනයේ දී
(ලකුණු 02 × 05 = 10)

05. සාරාංශය - පුරාණ ගොඩනැගිලිවල පියගැට පාමුල ශිලාමය අඩකවයක් ඇත. පසුව එය කලා නිර්මාණයක් විය. හැඩය අනුව සඳකඩ පහණ නම් විය. පැරැන්නන්-ගේ කලා කෞශල්‍යය හා සංස්කෘතිය දක්වන නිර්මාණයකි.

ඉහත ප්‍රධාන අදහස් ඇතුළත්ව ඡේදයක් සේ ලිවිය යුතු ය. වචන ගණන 30ට වැඩි නම් මුල් වචන 25 තුළ ඇති ප්‍රධාන අදහස් සඳහා පමණක් ලකුණු දෙන්න. වචන ගණන 20ට අඩු වන කල්හි ද අන්තර්ගතය සඳහා අනුපාතික ලකුණක් ලබා දෙන්න. වචන ගණන 30ට වැඩි වන කල්හි ද 20ට අඩු වන කල්හි ද වචන ගණන සඳහා ලකුණු නො ලැබේ.

වචන ගණන (ලකුණු 02)
අන්තර්ගතය (ලකුණු 05)
ශිල්පීය දක්ෂතා, නිවැරදි අක්ෂර භාවිතය, විරාම ලකුණු, වියත් වහර (ලකුණු 03)
(ලකුණු = 10)

06. 1. යදියෙක්, පොහොසතෙක්, දිළින්දෙක් (දුප්පතෙක්), කුලවතෙක්, සැඬොලෙක් (චණ්ඩාලයෙක්), නිවටයෙක්, බලවතෙක්

2. මිනිස් භාවයට උරුම වූ එකම ශරීරය තුළ විවිධ ස්වරූපයෙන් බෙදී පෙනී සිටීමට හැකි නිසා

යනාදි නිවැරදි වෙනත් පිළිතුරු සඳහා ද ලකුණු පිරිනමන්න.

3. කුඹුරෙහි නියැලි මිනිසා / ගොවියා

කම්හලේ වැඩ කරන්නා / කම්කරුවා

4. නරක ගතිගුණවලින් පිරී ඒවා තවදුරටත් ආරක්ෂා කරමින් මෙලොව වාසය කරන හිස උදුම්මවාගත් මිනිසුන්

(ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු දෙන්න.)

5. දුගුණෙන් - දුර්ගුණයෙන් /නරක ගතිගුණවලින් / අයහපත් ගුණාංගවලින්

ඉඳුරන් - ඉන්ද්‍රියන් / පසිඳුරන් / ඇස, කන නාසාදී ශාරීරික ඉන්ද්‍රියන්

(ලකුණු 02 × 05 = 10)

07. 1. කාලිදාස

2. අනූපම කවීත්වයත් අපූර්ව නිර්මාණ කෞශල්‍යයත් නිසා

3. නාට්‍ය රචකයෙකු හා කවියෙකු ලෙසින්

4. කාව්‍ය ශෛලියත් නාට්‍ය ශෛලියත් නිරුත්සාහයෙන් ම මුසු කොට ඒ දෙකෙහි අන්‍යෝන්‍ය නෑ සබඳකමක් ජනිත කොට දැක්වීම.

5. අනූපම - උපමා රහිත / උපමා කළ නොහැකි / උපමා නැති

ජනිත - ඉපිද / බිහි වී

(ලකුණු 02 × 05 = 10)